# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 13,007 — 1962 අප්‍රේල් 6 වැනි සිකුරාද — 1962.4.6**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවිකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 545 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 546 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 547 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 548 |
| මිල පාලන දැන්වීම් ... ... .... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 553 |
| " සුරාබද්ධ ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... ... | 553 |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 131**

අංකය : ඩී. 42/ආර්සීඑන් (කාණ්ඩය II).

**නිලධාරීන් පත් කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවික හමුදාවෙහි පහත සඳහන් පත් කිරීම් අනුමත කර තිබේ:—

1962 පෙබරවාරි මස 12 වෙනි දින සිට රා.ව.ලං. " එළාර " නෞකාවේ අණදෙන නිලධාරී වශයෙන් :

වැඩ බලන ලයිතන් එෆ්. ඒ. ඒ. සර්පන්ච්, රා.ලං.නා.හ.

1962 පෙබරවාරි 16 වැනි දින සිට රා.ව.ලං. " හන්සයා " නෞකාවේ අණදෙන නිලධාරී වශයෙන් :

ලයිතන් ඩබ්ලිව්. ඇන්. සී. බොතේජු, රා.ලං.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කුෂ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 මාර්තු 20 වෙනිද,
කොළඹදීය.

4-18

**1962 අංක 132**

අංකය : ඩී/වීඑෆ්/18/ඒ.

**රාජකීය ලංකා සෙවච්ඡා නාවික හමුදාව—රාජකීය ලංකා සෙවච්ඡා නාවික උප සේවයට මාරුකිරීම**

1962 අප්‍රේල් 1 වෙනි දින සිට රාජකීය ලංකා සෙවච්ඡා නාවික උප සේවයට පහත සඳහන් නිලධාරියා මාරුකිරීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කොට තිබේ:—

ලෙෆ්ටිනන්ට් කොමාන්ඩර් ඇන්. සී. ජේ. රුස්ටම්ජී, රාජකීය ලංකා සෙවච්ඡා නාවික හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කුෂ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 මාර්තු 23 වෙනිදා,
කොළඹදීය.

4-39

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

**1962 අංක 133**

අංකය : ඞී. 3/රෙක්ට්/23.

## රාජකීය ලංකා ගුවන් හමුදාව—කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකට පත් කිරීම

1960 අගෝස්තු මස 12 වෙනි දින සිට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පහත සඳහන් කරන ලද මහතා, රාජකීය ලංකා ගුවන් හමුදාවේ නියමු නිලධාරි වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකට පත් කොට, ඔහු පොදු රාජකාරි/නියමු ශාඛාවට ඇතුළත් කොට තිබේ.

නම : ඇන්තනි මොරිස් ඩෙන්සිල් ප්‍රනාන්දු.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කූ. දියෙස්,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 මාර්තු 27 වෙනිදා,
කොළඹ දීය.

4-208/1

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1962 අංක 134**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය:—

අංකය : ජේ එස් සී/පීපී./61.

ඒ. ටී. ආර්. කොරෙයා මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, අවිස්සාවේල්ලේ, දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අවිස්සාවේල්ලේ, රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අවිස්සාවේල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේ ඒඒ. 2/48.

ඒ. සී. ජේ. ගුණවර්ධන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මාර්තු 31 වැනි දින සිට, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 9162 සහ 10017 දරණ නඩු අවසාන වන තුරු ඇහිමට හා තීන්දු දීමට, අවිස්සාවේල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 23/59.

සී. ඩී. උදලාගම මහතා 1962 මාර්තු 1 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, මන්නාරමේ සහ වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික්. නඩුකාර ධුරයට.

අංකය : ජේ. එම්. 23/59.

එස්. එන්. රාජදුරේ මහතා 1962 මාර්තු 1 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, මන්නාරමේ සහ වවුනියාවේ, දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

ජේ එස් සී/පීපී. 4/62.

එන්. සිවඥානසුන්දරම් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, වී. එම්. කුමාරසාමි මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1962 මාර්තු 12 වැනි දින සිට, පේදුරුතුඩුවේ දිස්ත්‍රික් නඩුකාර ධුරයේ හා පේදුරු තුඩුවේ රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේ එස් සී/පීපී. 6/61.

එස්. එස්. කුලතිලක මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, රත්නපුරේ, දිස්ත්‍රික් නඩුකාර ධුරයට, රත්නපුරේ රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේ. එම්. 2/56 (III).

ඒ. විජේයරත්න මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. ඒෆ්. ද සිල්වා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මාර්තු 2 වැනි දින සිට, කොළඹ, ළමා මහෙස්ත්‍රාත් ධුරයේ හා මීගමුවේ. අතිරේක මහේස්ත්‍රාත් ධුරයේ, පානදුරේ. අතිරේක මහේස්ත්‍රාත් ධුරයේ, හා ගම්පහ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේ එම්. 2/56 (III).

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1962 මාර්තු 12 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා (කුලියපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී./පීපී. 6/61.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1962 මාර්තු 8 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ලංකා අධිකරණ සේවයේ අතිරික්ත නිලධාරියෙකු සහ 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ. එම්. 7/61.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, දෙහිවල-ගල්කිස්සේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

ඒ. විජයරත්න මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මාර්තු 8 වැනි දින සිට, කොළඹ, ළමා මහේස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට, හා මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ, පානදුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ, හා ගම්පහ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට.

අංකය : සීජේපී/එස්. 25/61.

ජේ. බී. සී. සුවාරිස් මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, අධිකරණ සේවයේ නිලධාරියකු වශයෙන්.

අංකය : ජේ එස් සී/පීපී.6/61.

එම්. ඒ. එම්. හුසේන් මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, ලංකා අධිකරණ සේවයේ අතිරික්ත නිලධාරියකු වශයෙන් හා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේ එම්. 2/56 (III).

එම්. ජමීල් මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරනතුරු, (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට

අංකය : ජේ එස් සී/පීපී 4/62.

එම්. ජමීල් මහතා 1962 මාර්තු 12 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, යාපනේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, යාපනේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, කයිට්ස්, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට. හා යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒඒ. 37/48.

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අප්‍රේල් 3 වැනි දින සිට, කුලියාපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 13179 දරණ නඩුව අවසාන වන තුරු ඇහිමට හා තීන්දුව දීමට, (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 13ඒ/59.

ටී. ඩී. ඒ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 මාර්තු 24 වැනි දින, මාතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ එල්. 51 ඒ/54 (ඒ).

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උදලාගම මහතා 1962 මාර්තු 23 වැනි දින, 24 වැනි හා 30 වැනි දින සිට 1962 අප්‍රේල් 1 වැනි දින දක්වා, කෑගල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට හා කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේ එල්. 68සී 51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 මාර්තු 29 වැනි දින සිට 31 වැනි දින දක්වා, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, අනුරාධපුරේ, අතිරේක මහේස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, වවුනියාවේ, අතිරේක මහේස්ත්‍රාත් ධූරයට, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට හා ත්‍රිකුණාමලේ, අතිරේක මහේස්ත්‍රාත් ධූරයට.

අංකය : ජේඑල්. 57ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1962 මාර්තු 25 වැනි දින, ගම්පොල පිහිටි උසාවියේ ක්‍රියා කරණ පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, හා ගම්පොල, අතිරේක මහේස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේඑල්.49ඒ/53.

එම්. පී. සී. රත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. ගුණරත්න මහතා 1962 මාර්තු 23 වැනි දින සිට 26 වැනි දින දක්වා, මීගමුවේ, අතිරේක මහේස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, මීගමුවේ, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධූරයට හා මීගමුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 27ඒ/2. 57.

එම්. ඒ. එම්. හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 මාර්තු 28 වැනි දින සිට 31 වැනි දින දක්වා, කොළඹ, අතිරේක මහේස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, කොළඹ, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධූරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 2ඒ/56.

ඩී. එස්. එල්. පී. අබේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. ආර්. ද අල්විස් මහතා 1962 මාර්තු 28 වැනි දින, කොළඹ, අතිරේක මහේස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, කොළඹ, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධූරයට, දෙහිවල-ගල්කිස්සේ, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධූරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : පීඒ. මිශ්‍ර/57.

කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා 1962 අප්‍රියෙල් 2 වැනි, 4 වැනි, 5 වැනි, 9 වැනි, 11 වැනි, 17 වැනි, 19 වැනි, 23 වැනි හා 30 වැනි දිනයන්හි, හෝ නැවත නියමයක් කරන තුරු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, උතුරු සහ දකුණු හුරුළු පලාත්වල ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට හා කලාගම් පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඒ. මිශ්‍ර/57.

ඩී. පී. බී. මහදිවුල්වැව මහතා 1962 අප්‍රියෙල් 3 වැනි, 6 වැනි, 7 වැනි, 18 වැනි, 21 වැනි දිනයන්හි සහ 25 වැනි හා 27 වැනි දිනයන්හි හෝ නැවත නියමයක් කරන තුරු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, උතුරු සහ දකුණු හුරුළු පලාත්වල ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට හා කලාගම් පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එච්. සිරිවර්ධන මහතා 1962 මාර්තු 30 වැනි හා 31 වැනි දියන්හි, අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරලයේ සහ පාත බුලත්ගම සහ පනාවල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට හා බෙලිගල් සහ කුරුවිට කෝරලයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඒ. මිශ්‍ර/57.

එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා 1962 අප්‍රියෙල් 2 වැනි දින සිට 7 වැනි දින දක්වා, 9 වැනි දින සිට 13 වැනි දින දක්වා, 16 වැනි දින සිට 19 වැනි දින දක්වා, 21 වැනි දින, 23 වැනි දින සිට 28 වැනි දින දක්වා හා 30 වැනි දිනද, හෝ නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 5/50.

කේ. වී. ඒ. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඕ. දල්පතාදු මහතා 1962 අප්‍රියෙල් 11 වැනි දින සිට 13 වැනි දින දක්වා, 16 වැනි දින සිට 19 වැනි දින දක්වා, සහ 21 වැනි දිනද, ගාලුවත දිස්ත්‍රික්කයේ, උතුරු සහ දකුණු පිටිගල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 5/50.

කේ. වී. ඒ. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. හේරත් මහතා 1962 අප්‍රියෙල් 2 වැනි දින සිට 7 වැනි දින දක්වා, සහ 9 වැනි හා 10 වැනි දිනයන් හි, ගාලුවත දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු පිටිගල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. සභාපතිපිල්ලේ මහතා 1962 මාර්තු 27 වැනි දින සිට 29 වැනි දින දක්වා, පේදුරුතුඩුව දිස්ත්‍රික්කයේ, නැන්මරඩච්, පච්චිලපිපාලෙයි-කරච්චි පූනකාරි-තුන්තුකායි, ගම්බද උසාවි සභාපති ධූරයේ වැඩ බැලීමට.

අංකය : පීඒ. 22/57.

ට. එස්. බුල් මහතා 1962 අප්‍රියෙල් 6 වැනි දින, අම්බලන්තොට ගම්බද උසාවියේ අංක 4341 දරණ අපරාධ නඩුව හා 552 දරණ සිවිල් නඩුවද ඇසීමට, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ සහ මාගම් පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයට.

අංකය : පීඒ. 53/57.

ඩී. එල්. ඩබ්ලිව්. ගුණසේකර මහතා 1962 අප්‍රියෙල් 9 වැනි දින, මාදොල ගම්බද උසාවියේ අංක 5954 දරණ අපරාධ නඩුව ඇසීමට, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත, මැද සහ නවදුන් කෝරලයන් හි ගම්බද උසාවි අතිරේක සභාපති ධූරයට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 මාර්තු 28 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

4-121

---

# වෙනත් පත්කිරීම් ආදිය

**1962 අංක 135**

අංකය : ඩී. 3/රෙක්ට්/23.

## රාජකීය ලංකා ගුවන් හමුදාව—උසස් කිරීමක්

1951 ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) නීතියේ 3 වැනි රෙගුලාසිය ප්‍රකාර පහත සඳහන් උසස් කිරීම කරනු ලැබේ :—

1961 අගෝස්තු මස 12 වෙනි දින සිට පියසරු නිලධාරි වශයෙන්—

නියමු නිලධාරි ඒ. ඇම්. ඩී. ප්‍රනාන්දු (01117)—පොදු රාජකාරි/ නියමු.

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1962 මාර්තු 27 වෙනිදා,
කොළඹ දීය.

4-208/2

### 1962 අංක 136

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගුවේ :—

අංකය : 74/2/1 (ඇම් ඇෆ්ජ්).

ආර්. එම්. බී. සේනානායක මහතා 1962 පෙබරවාරි මස 22 වැනි දින සිට වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

අංකය : 74/2/1 (ඇම් ඇෆ්ජ්).

එස්. වී. ඩබ්ලිව්. ගුණවර්ධන මහතා 1962 පෙබරවාරි මස 22 වැනි දින සිට වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

අංකය : 74/2/1 (ඇම් ඇෆ්ජ්).

කේ. ඇම්. යූ. ජයරත්න මහතා 1962 පෙබරවාරි මස 22 වැනි දින සිට වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

අංකය : 74/2/108 (ඇම් ඇෆ්ජ්).

ඒ. රී. එච්. සඳරත්න මහතා 1962 පෙබරවාරි මස 22 වැනි දින සිට වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

අංකය : 74/2/210 (ඇම් ඇෆ්ජ්).

ඒ. එඩ්වර්ඩ් මහතා 1962 මාර්තු මස 6 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

අංකය : 74/2/210 (ඇම් ඇෆ්ජ්).

එම්. ශ්‍රීකාන්තා මහතා 1962 මාර්තු මස 12 වැනි දින සිට කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

අංකය : 74/2/210 (ඇම් ඇෆ්ජ්).

ඒ. ඔ. වීරසිංහ මහතා 1962 මාර්තු මස 7 වැනි දින සිට කම්කරු සහ ජනසතු සේවා අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ශ. ජ. අමරසිංහ,
වැඩබලන භාණ්ඩාගාරයේ ලේකම්.

මුදල් අමාත්‍යාංශය,
කොළඹ,
1962 මාර්තු මස 27.

4-23

---

### 1962 අංක 137

මගේ අංකය : ඒජේ. 34/6/61.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

**සමාදාන විනිශ්චයකරුවන්**

1. එස්. දිරසූරිය මහතා බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,
2. ලංකා සිවිල් සේවක පී. ද එෆ්ජ්. ඩබ්ලිව්. ගුණරත්න මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,
3. එච්. ඊ. එස්. වික්‍රමරත්න මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,
4. සී. එන්. එෆ්ජ්. ද සිල්වා මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

**සමාදාන විනිශ්චයකරුවන් (නිල බලයෙන්)**

5 ලංකා සිවිල් සේවක ආර්. එල්. ආර්නොල්ඩා මහතා ආහාර දෙපාර්තමේන්තුවේ ආහාර කොමසාරිස් ධුරය දරන කාලයතුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

6. ලංකා සිවිල් සේවක එම්. සිවනාදන් මහතා ආහාර දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ආහාර කොමසාරිස් (සැපයීම) ධුරය දරණ කාලය තුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

7. ලංකා සිවිල් සේවක සී. එල්. චන්ද්‍රසේකර මහතා ආහාර දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ආහාර කොමසාරිස් (පාලනය) ධුරය දරණ කාලයතුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

8. ලංකා සිවිල් සේවක එස්. බී. කේ. තිලකරත්න මහතා කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කාර්යාල සහකාර ධුරය දරණ කාලයතුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්ද,

පත්කර ඇත්තේ ය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962, මාර්තු මස 31 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

4-143

---

### 1962 අංක 138

මාදම්පාහෙට්ටි ආරච්චිගේ වික්‍රමරත්න තිසේරා මහතා ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 මාර්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

4-42

---

### 1962 අංක 139

සින්නප්පා සිවසිබ්‍රමනියම් මහතා පේදුරු තුඩුව අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවන්ගෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

4-116

---

### 1962 අංක 140

පෙරුම්බඩගේ ඔලිවර් රෙජිනෝල්ඩ් විජේතිලක මහතා කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 මාර්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

4-41

---

## ආණ්ඩුවේ නිවේදන

අංකය : පී. ආර්/ඒඑෆ්/108.

ඉරාකය වෙනුවෙන් කොළඹ සිටින ගරු කොන්සල් තැන වන, එම්. පලීල් ඒ. කපූර් මහතා 1962 මාර්තු මස 29 වෙනි දින සිට දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ, ඉරාකය වෙනුවෙන් වැඩ බලන ගරු කොන්සල් ලෙස මොහිදීන් ඒ. කපූර් මහතා, විදේශ කටයුතු පිළිබඳ ඇමතිනිය විසින් පිළිගන්නා ලදී.

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1962 මාර්තු මස 30 වෙනි දින,
කොළඹ දී ය.

4-167

ආර්. බී.—බී. 104/44.

## භාර ආඥාපනත

### 114 වෙනි වගන්තිය යටතේ ආඥාව

භාර ආඥාපනතෙහි (87 වෙනි අධිකාරය) 114 වෙනි වගන්තිය යටතේ නීතිගත සංස්ථාවක් වශයෙන් නීතිගත කරනු ලැබීම සඳහා—

ශ්‍රීමත් ලලිත රාජපක්ෂ,
නිව්ටන් එදිරිසිංහ,
ඒ. විජයරත්න,
ආර්. පියදාස ද සිල්වා,
ආර්. ද ඉසැඩ් ගුණවර්ධන,
ඇන්. ඇස්. ද ඇස්. වික්‍රමසිංහ සහ
ඩබ්ලිව්. ඇම්. ගුණරත්න

යන බලපිටියේ තරුණ බෞද්ධ සමිතියේ භාරකරුවන් අධිකරණ ඇමතිවරයාගෙන් ඉල්ලුම් කර ඇති හෙයින් :

ඉහත කී වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම, මේ ආඥාවෙන් ඉහත කී භාරකරුවන් නීතිගත සංස්ථාවක් වශයෙන් නීතිගත කරනු ලබන ලෙස බලය පවරා—

(අ) එකී භාරකරුවන් ද, එකී භාරයේ ව්‍යවස්ථා යටතේ එවකට යථා පරිදි පත් කරනු ලැබූ ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් ද "බලපිටිය තරුණ බෞද්ධ සමිතිය" යන නාමය හා විලාසය යටතේ අවිච්ඡින්න පරම්පරාව හා පොදු මුද්‍රාවක් සහිත බලය ලත් නීතිගත සංස්ථාවක් විය යුතු බවද;

(ආ) චංචල වූ ද නිශ්චල වූ ද සියලු ආකාරයෙන් යුත් දේපළ එකී භාරය වෙනුවෙන් ඒ නාමයෙන් හා විලාසයෙන් ඔවුන් හට ලැබිය හැකි බව, හිමි විය හැකි බව හා ඒ පිළිබඳව සුදුස්සක් කළහැකි බව ද;

(ඇ) එකී භාරය පිළිබඳව සියලු නීතිකෘත්‍යවල දී හා නඩුවල දී යම් අධිකරණයක හෝ අන් තැනක නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට, නිදහසට කරුණු කීමට හා නිදහසට කරුණු කියනු ලැබීමට ඔවුන් නිත්‍යානුකූලව සමත් ව සුදුසු විය යුතු බවද;

නියම කොට ප්‍රකාශ කරමි.

මේ ආඥාව අවශ්‍යය යි මට පෙනී යා හැකි ආකාරයෙන් අවලංගු කළ හැකි ය, නැතහොත් කලින් කල වෙනස් කළ හැකිය, නැත හොත් සංශෝධනය කළ හැකි ය.

සැම් පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ ඇමති.

1962. 3. 28. කොළඹ.

4-163

---

## දැන්වීමයි

කළුතර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් හේම සතන්කුමාර් අගලවත්ත මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

4-117

---

## දැන්වීමයි

ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් කන්කානිඅච්චි හග්ගල්ලගේ මිල්ටන් විජය සුමනරත්න මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 මාර්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

4-12

---

## බන්ධනාගාර ආඥාපනත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥාපනතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥාපනතේ 32 (1) (අ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උපලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට එක් අවුරුදු කාලය කට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන්, කර්මාන්ත, ස්වදේශ හා සංසකෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

ඇම්. ජේ. පෙරේරා,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1962 මාර්තු 29 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශය.

### උපලේඛනය

| I | II |
|---|---|
| මාතර බන්ධනාගාරය | ජේ. සී. අභයවීර මහතා |
| | ඇම්. අන්වර් ජුනුස් මහතා |

4-97

---

## බන්ධනාගාර ආඥාපනත

වර්ෂ 1939 අංක 43 දරණ ආඥාපනතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥාපනතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උපලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට එක් අවුරුදු කාලය කට, උප ලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන්, කර්මාන්ත, ස්වදේශ හා සංසකෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

ඇම්. ජේ. පෙරේරා,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1962 මාර්තු මස 30 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශය.

### උපලේඛනය

| I | II |
|---|---|
| යාපනේ බන්ධනාගාරය | සැම් පී. සොලොමන්ස් |

4-93

---

## බන්ධනාගාර ආඥාපනත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥාපනතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥාපනතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උපලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට එක් අවුරුදු කාලය කට, උප ලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන්, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

ඇම්. ජේ. පෙරේරා,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1962 මාර්තු මස 30 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශය.

### උපලේඛනය

| I | II |
|---|---|
| මහර බන්ධනාගාරය | ඒ. ඒ. සේනානායක මහතා |

4-95

ඇල්. සී.—බී. 14/58.

## වර්ෂ 1958 අංක 12 දරන තේ ආධාර පනත

වර්ෂ 1958 අංක 12 දරන තේ ආධාර පනතේ 10 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමතිවරයා විසින් පනවන නියෝගය.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමති.

කොළඹ 1, 1962-3-28.

### නියෝගය

අංක 11,573 සහ 1958 ඔක්තෝබර් මස 31 වැනි දින දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 ආධාර ක්‍රමයේ සේවකයින්ගේ (අර්ථ සාධක අරමුදල) නියෝගවල 4 (1) වැනි නියෝගය පහත සඳහන් අයුරු සංශෝධනය කරනු ලැබේ :—

(I) (සී) දරන ඡේදයේ ඇති " සංයුක්ත මණ්ඩලයක " යන වචන වෙනුවට " සංයුක්ත මණ්ඩලයක ; හෝ " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(II) (සී) දරන ඡේදය අවසානයේම, පහත සඳහන් අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඩී) සිංහල භාෂාවෙන් කටයුතු කිරීමට නොහැකිවීම නිසා 1963 දෙසැම්බර් මස 31 වැනිදා හෝ ඊට පෙර ආධාර ක්‍රමය යටතේ සේවයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කර එසේ විශ්‍රාම ලබන කෙනකුට. "

4-76

---

එල්. ඩී.—බී. 51/50.

## කොළඹ වරාය (පරිපාලන) පනත

කොළඹ වරාය (පරිපාලන) පනතෙහි (238 වෙනි අධිකාරය) 12 (2) වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව කම්කරු හා ජනසතු සේවා ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝග.

ඇම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා ඇමති.

1962-3-27 වෙනි දින,
කොළඹ දීය.

### නියෝග

1. 2 වෙනි නියෝගයෙහි විධිවිධානවලට යටත්ව; බෝත් විස්සේ විදුලි බල සහිත තටාක බද දෙඔකරය පාවිච්චි කිරීම සඳහා වරාය කොමසාරිස් විසින් අය කළයුතු ගාස්තු මෙසේ ය :—

| | | රු. ශ. |
|---|---|---|
| (ඒ) පළමුවන එසවීමට | ... ... | 50.00 |
| (බී) ඉන් පසුව එක් එක් එසවීමකට— | | |
| (i) ප්‍රධාන ඔසොවනුව පාවිච්චි කළ විට | ... | 40.00 |
| (ii) සහාය ඔසොවනුව පාවිච්චි කළ විට | ... | 33.00 |

2. ඉරිදා දිනයන්හි ද නිවාඩු දිනයන්හිද අනිකුත් දිනයන්හි සාමාන්‍ය වැඩ කරන වේලාවෙන් බැහැර යම් අවස්ථාවක ද බෝත් විස්සේ නෞකා තටාක බද දෙඔකරය පාවිච්චි කිරීම සඳහා සියයට තිස්තුනකුත් තුනෙන් එකක් එකතු කරනු ලැබූ 1 වැනි නියෝගයෙහි සඳහන් ගාස්තු වරාය කොමසාරිස් විසින් අය කළයුතුය.

මේ නියෝගයෙහි " සාමාන්‍ය වැඩ කරන වේලාව " යන පාඨයෙන් සතියේ දිනයන්හි පූ. භා. 7 සිට අ. භා. 4 දක්වා ද, සෙනසුරාදා දින යන්හි පූ. භා. 7 සිට දවල් 12 දක්වාද යන කාලය අදහස් වේ.

4-74

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සමාජිකයකුව සිට ඉල්ලා අස්වූ ඇෆ්ජ්. හාපර් මහතා වෙනුවට එම පඩි පාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩි පාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමති තුමන් විසින් ඩබ්ලිව්. මොලගොඩ මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩි පාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
වැඩබලන සථිර ලේකම්වරයා.

1962 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දීය.

4-54

---

## 1946යේ ලංකා (පාර්ලිමේන්තු තේරීම් පිළිබඳ) රාජ්‍යසභා ආඥාව

### 1961 පාර්ලිමේන්තු නාම ලේඛන සංශෝධන කිරීම

අංක 5 දරණ මැතිවරණ කොට්ඨාශය—වත්තල
අංක 6 දරණ මැතිවරණ කොට්ඨාශය—මීගමුව
අංක 7 දරණ මැතිවරණ කොට්ඨාශය—කටාන
අංක 8 දරණ මැතිවරණ කොට්ඨාශය—දිවුලපිටිය
අංක 9 දරණ මැතිවරණ කොට්ඨාශය—මීරිගම
අංක 10 දරණ මැතිවරණ කොට්ඨාශය—මිනුවන්ගොඩ
අංක 11 දරණ මැතිවරණ කොට්ඨාශය—අත්තනගල්ල
අංක 12 දරණ මැතිවරණ කොට්ඨාශය—ගම්පහ
අංක 13 දරණ මැතිවරණ කොට්ඨාශය—ජාඇල
අංක 14 දරණ මැතිවරණ කොට්ඨාශය—මහර
අංක 15 දරණ මැතිවරණ කොට්ඨාශය—දොම්පෙ
අංක 16 දරණ මැතිවරණ කොට්ඨාශය—කැළණිය
අංක 17 දරණ මැතිවරණ කොට්ඨාශය—කොලොන්නාව
අංක 18 දරණ මැතිවරණ කොට්ඨාශය—කෝට්ටේ
අංක 20 දරණ මැතිවරණ කොට්ඨාශය මොරටුව
අංක 21 දරණ මැතිවරණ කොට්ඨාශය කැස්බෑව
අංක 22 දරණ මැතිවරණ කොට්ඨාශය—කොට්ටාව
අංක 23 දරණ මැතිවරණ කොට්ඨාශය—හෝමාගම
අංක 24 දරණ මැතිවරණ කොට්ඨාශය—අවිස්සාවේල්ල

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාම ලේඛන සහතික කරන ලද බවත්, එකී නාම ලේඛන කාර්යාල වේලාවන්හි දී පරීක්ෂා කර බලා ගැනීම පිණිස කොළඹ කච්චේරියේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. පී. තම්බයියා,
අංක 5—වත්තල, අංක 6—මීගමුව, අංක 7—කටාන, අංක 8—දිවුලපිටිය, අංක 9—මීරිගම, අංක 10—මිනුවන්ගොඩ, අංක 11—අත්තනගල්ල, අංක 12—ගම්පහ, අංක 13—ජාඇල, අංක 14—මහර, අංක 15—දොම්පෙ, අංක 16—කැළණිය, අංක 17—කොලොන්නාව, අංක 18—කෝට්ටේ, අංක 20—මොරටුව, අංක 21—කැස්බෑව, අංක 22—කොට්ටාව, අංක 23—හෝමාගම සහ අංක 24—අවිස්සාවේල්ල යන මැතිවරණ කොට්ඨාශවල ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන.

1962 ක්වූ මාර්තු මස 28 වෙනි දින,
කොළඹ කච්චේරියේ දීය.

4-213/1

---

## 1946යේ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ රාජසභා ආඥාව

### ඡන්දදායක නාම ලේඛන සංශෝධනය කිරීම—1961

අංක 25 දරණ හොරණ මැතිවරණ කොට්ඨාශය
අංක 26 දරණ බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශය
අංක 27 දරණ බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාශය
අංක 28 දරණ පානදුර මැතිවරණ කොට්ඨාශය
අංක 29 දරණ කළුතර මැතිවරණ කොට්ඨාශය
අංක 30 දරණ බේරුවල මැතිවරණ කොට්ඨාශය
අංක 31 දරණ මතුගම මැතිවරණ කොට්ඨාශය
අංක 32 දරණ අගලවත්ත මැතිවරණ කොට්ඨාශය

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාම ලේඛන සහතික කරන ලද බවත්, එකී නාම ලේඛන කාර්යාල වේලාවන්හි දී පරීක්ෂා කර බලා ගැනීම පිණිස කළුතර මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. එච්. වී. ද සිල්වා,
අංක 25 දරණ හොරණ මැතිවරණ කොට්ඨාශය, අංක 26 දරණ බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශය, අංක 27 දරණ බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාශය, අංක 28 දරණ පානදුර මැතිවරණ කොට්ඨාශය, අංක 29 දරණ කළුතර මැතිවරණ කොට්ඨාශය, අංක 30 දරණ බේරුවල මැතිවරණ කොට්ඨාශය, අංක 31 දරණ මතුගම මැතිවරණ කොට්ඨාශය, අංක 32 දරණ අගලවත්ත මැතිවරණ කොට්ඨාශය, යන මැතිවරණ කොට්ඨාශවල ලියාපදිංචි කිරීමේ සහකාර නිලධාරී තැන.

1962 මාර්තු මස 31 වැනි දින,
කළුතර මැතිවරණ කාර්යාලයේ දීය.

4-213/2

## 1946 යේ ලංකා (පාර්ලිමේන්තු තේරීම් පිළිබඳ) රාජසභා ආඥුව

**1961 පාර්ලිමේන්තු නාමලේඛන සංශොධනය කිරීම**

අංක 33 දරණ දඹුල්ල මැතිවරණ කොට්ඨාශය
අංක 34 දරණ ලග්ගල මැතිවරණ කොට්ඨාශය
අංක 35 දරණ මාතලේ මැතිවරණ කොට්ඨාශය
අංක 36 දරණ රත්තොට මැතිවරණ කොට්ඨාශය

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාම ලේඛන සහතික කරන ලද බවත්, එකී නාම ලේඛන කායඝිල වේලාවන් හි දී පරීක්‍ෂා කර බලා ගැනිම පිණිස මාතලේ කච්චේරියේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥුවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

සු. ඒ. ගුණරත්න,
අංක 33 දරණ දඹුල්ල අංක 34 දරණ ලග්ගල අංක 35 දරණ මාතලේ අංක 36 දරණ රත්තොට මැතිවරණ කොට්ඨාශ ලියා පදිංචි කිරීමේ නිළධාරි.

කච්චේරිය, මාතලේ,
1962 මාර්තු මස 30
වෙනි දින.

4-213/3.

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥුව

**වාර්ෂික ඡන්දදායක ලැයිස්තු සංශෝධනය—1961**

අංක 71 දරණ බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය
අංක 72 දරණ මුල්කිරිගල මැතිවරණ කොට්ඨාශය
අංක 73 දරණ තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත්, එකී නාමලේඛන කායඝිල වේලාවන් හි දී පරීක්‍ෂා කර බලා ගැනීම පිණිස හම්බන්තොට කච්චේරියේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥුවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. කදිරකාමනාදන්,
අංක 71 දරණ බෙලිඅත්ත, අංක 72 දරණ මුල්කිරිගල, සහ අංක 73 දරණ තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාශ යන්හි ලියාපදිංචිකිරීමේ නිලධාරි තැන.

1962. 3. 30 වෙනි දින,
හම්බන්තොට, කච්චේරියේ දීය.

4-213/4

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥුව

**1961 පාර්ලිමේන්තු නාමලේඛන සංශෝධනය කිරීම**

මැතිවරණ කොට්ඨාශ අංක 74—කයිට්ස්
මැතිවරණ කොට්ඨාශ අංක 75—වඩ්ඩුකොඩ්ඩෙයි
මැතිවරණ කොට්ඨාශ අංක 76—කන්කසන්තුරේ
මැතිවරණ කොට්ඨාශ අංක 77—උඩුවිල්
මැතිවරණ කොට්ඨාශ අංක 78—යාපනය
මැතිවරණ කොට්ඨාශ අංක 79—නල්ලූර්
මැතිවරණ කොට්ඨාශ අංක 80—කෝපායි
මැතිවරණ කොට්ඨාශ අංක 81—උඩුපිඩ්ඩි
මැතිවරණ කොට්ඨාශ අංක 82—පේදුරුතුඩුව
මැතිවරණ කොට්ඨාශ අංක 83—චාවාකච්චේරි
මැතිවරණ කොට්ඨාශ අංක 84—කිලිනොච්චි

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත්, එකී නාමලේඛන කායඝිල වේලාවන් හි දී පරීක්‍ෂා කර බලා ගැනීම පිණිස යාපනයේ කච්චේරියේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥුවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. ආර්. උඩුගම,
ලියාපදිංචිකිරීමේ නිලධාරි තැන.
මැතිවරණ කොට්ඨාශ අංක 74—කයිට්ස්, මැතිවරණ කොට්ඨාශ අංක 75—වඩ්ඩුකොඩ්ඩෙයි, මැතිවරණ කොට්ඨාශ අංක 76—කන්කසන්තුරේ, මැතිවරණ කොට්ඨාශ අංක 77—උඩුවිල්, මැතිවරණ කොට්ඨාශ අංක 78—යාපනය, මැතිවරණ කොට්ඨාශ අංක 79—නල්ලූර්, මැතිවරණ කොට්ඨාශ අංක 80—කෝපායි, මැතිවරණ කොට්ඨාශ අංක 81—උඩුපිඩ්ඩි, මැතිවරණ කොට්ඨාශ අංක 82—පේදුරුතුඩුව, මැතිවරණ කොට්ඨාශ අංක 83—චාවාකච්චේරි, මැතිවරණ කොට්ඨාශ අංක 84—කිලිනොච්චි.

1962 මාර්තු මස 28,
යාපනේ කච්චේරියේ දීය.

4-213/5

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥුව

**ඡන්දදායක නාමලේඛන සංශෝධනය කිරීම—1961**

මැතිවරණ කොට්ඨාශය අංක 85—මන්නාරම

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශයේ නාමලේඛනය සංශෝධනය කර සහතික කොට ඇති බවත් එකී නාමලේඛනය මන්නාරම් කච්චේරියේ දී කායඝිල වේලාවන් හිදී පරීක්‍ෂාකර බැලීමට හැකි බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥුවේ 22 (1) වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇන්. පී. ජේගනාදන්,
අංක 85—මන්නාරම මැතිවරණ කොට්ඨාශයේ ලියා පදිංචිකිරීමේ නිලධාරි තැන.

කච්චේරිය, මන්නාරම,
1962 මාර්තු මස 28 වෙනි දින දීය.

4-213/6

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥුව

**ඡන්දදායක නාමලේඛන සංශෝධනය කිරීම—1961**

මැතිවරණ කොට්ඨාශ අංක 87—ත්‍රිකුණාමලය
මැතිවරණ කොට්ඨාශ අංක 88—මුතූර්.

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත්, එකී නාමලේඛන කායඝිල වේලාවන් හිදී පරීක්‍ෂා කර බලා ගැනීම පිණිස ත්‍රිකුණාමලය මැතිවරණ කායඝිලයේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥුවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී. ඇම්. ඒ. ස්පෙල්ඩ්වින්ඩ්,
අංක 87 දරණ ත්‍රිකුණාමලය සහ අංක 88 දරණ මූතූර් යන මැතිවරණ කොට්ඨාශවල ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන.

1962 කේ මාර්තු මස 28 වෙනි දින,
ත්‍රිකුණාමලය මැතිවරණ කායඝිලයේ දීය.

4-213/7

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥුව

**ඡන්දදායක නාමලේඛන සංශෝධනය කිරීම—1961**

අංක 89 දරණ කල්කුඩා මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 90 දරණ මඩකලපු මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 92 දරණ පද්දිරිප්පු මැතිවරණ දිස්ත්‍රික්කය

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත් එකී නාමලේඛන කායඝිල වේලාවන් හිදී පරීක්‍ෂා කර බලා ගැනිම පිණිස මඩකලපු කච්චේරියේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥුවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී. අලුවිහාරෙ,
මැතිවරණ දිස්ත්‍රික්කවල ලියාපදිංචි කිරීමේ නිලධාරිතැන.
අංක 89 දරණ කල්කුඩා මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 90 දරණ මඩකලපු මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 92 දරණ පද්දිරිප්පු මැතිවරණ දිස්ත්‍රික්කය.

1962.3.26,
මඩකලපුව කච්චේරියේ දීය.

4-213/8

---

## 1946යේ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥුව

**ඡන්දදායක නාමලේඛන සංශෝධනය කිරීම—1961**

අංක 96—පුත්තලම මැතිවරණ කොට්ඨාශය
අංක 102—හලාවත මැතිවරණ කොට්ඨාශය
අංක 103—නාත්තන්ඩිය මැතිවරණ කොට්ඨාශය
අංක 104—වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාශය

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත්, එකී නාමලේඛන කායඝිල වේලාවන් හි දී පරීක්‍ෂා කර බලා ගැනීම පිණිස පුත්තලම් කච්චේරියේ තබා ඇති

බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. බී. දිසානායක,
අංක 96—පුත්තලම මැතිවරණ කොට්ඨාශය,
අංක 102—හලාවත මැතිවරණ කොට්ඨාශය,
අංක 103—නාත්තන්ඩිය මැතිවරණ කොට්ඨාශය,
සහ අංක 104—වෙන්නප්පුව මැතිවරණ
කොට්ඨාශවල ලියාපදිංචි කිරීමේ නිලධාරිතැන.

1962 මාර්තු මස 31 වෙනි දින,
පුත්තලම් කච්චේරියේ දීය.

4-213/9

---

## 1946යේ ලංකා (පාර්ලිමේන්තු තේරීම් පිළිබඳ) රාජසභා ආඥාව

### 1961 නාමලේඛන සංශෝධනය

අංක 112—අනුරාධපුරය මැතිවරණ කොට්ඨාශය
අංක 113—මැදවච්චිය මැතිවරණ කොට්ඨාශය
අංක 114—හොරොව්පොතාන මැතිවරණ කොට්ඨාශය
අංක 115—මිහින්තලේ මැතිවරණ කොට්ඨාශය
අංක 116—කලාවැව මැතිවරණ කොට්ඨාශය
අංක 117—කැකිරාව මැතිවරණ කොට්ඨාශය

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත්, එකී නාමලේඛන කාර්යාල වේලාවන්හි දී පරීක්‍ෂා කර බලා ගැනීම පිණිස අනුරාධපුර ලේකම් කාර්යාලයේ මැතිවරණ අංශයේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇස්. ඇන්. රාජා,
අංක 112—අනුරාධපුරය, අංක 113—මැදවච්චිය, අංක 114—හොරොව්පොතාන, අංක 115—මිහින්තලේ, අංක 116—කලාවැව, අංක 117—කැකිරාව යන මැතිවරණ කොට්ඨාශ ලියාපදිංචිකිරීමේ සහකාර නිලධාරි තැන.

වර්‍ෂ 1962ක් වූ මාර්තු මස 28 වෙනි දින,
අනුරාධපුර කච්චේරියේ මැතිවරණ කාර්යාලයේ දීය

4-213/10

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### ඡන්දදායක නාමලේඛන සංශොධනය—1961

මැතිවරණ කොට්ඨාශය අංක 118—මින්නේරිය
මැතිවරණ කොට්ඨාශය අංක 119—පොළොන්නරුව

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත්, එකී නාමලේඛන කාර්යාල වේලාවන්හි දී පරීක්‍ෂා කර බලා ගැනීම පිණිස පොළොන්නරුව කච්චේරියේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. කන්දසාමි,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන,
මැතිවරණ කොට්ඨාශ අංක 118—මින්නේරිය,
මැතිවරණ කොට්ඨාශ අංක 119—පොළොන්නරුව.

පොළොන්නරුව කච්චේරිය,
1962 මාර්තු 31 දින.

4—213/11.

---

## 1946යේ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### 1961 පාර්ලිමේන්තු නාමලේඛන සංශෝධනය කිරීම

අංක 120 දරණ මහියන්ගන මැතිවරණ කොට්ඨාශය
අංක 122 දරණ පස්සර මැතිවරණ කොට්ඨාශය
අංක 123 දරණ බදුල්ල මැතිවරණ කොට්ඨාශය
අංක 124 දරණ සොරනාතොට මැතිවරණ කොට්ඨාශය
අංක 125 දරණ ඌව-පරණගම මැතිවරණ කොට්ඨාශය
අංක 126 දරණ වැලිමඩ මැතිවරණ කොට්ඨාශය
අංක 127 දරණ බණ්ඩාරවෙල මැතිවරණ කොට්ඨාශය
අංක 128 දරණ හපුතල මැතිවරණ කොට්ඨාශය

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත්, එකී නාමලේඛන කාර්යාල වේලාවන්හි දී පරීක්‍ෂාකර බලා ගැනීම පිණිස බදුල්ල කච්චේරියේ ඡන්ද කාර්යාලයේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇන්. විජේවර්ධන,
අංක 120 දරණ මහියන්ගන, අංක 122 දරණ පස්සර, අංක 123 දරණ බදුල්ල, අංක 124 දරණ සොරනාතොට, අංක 125 දරණ ඌව-පරණගම, අංක 126 දරණ වැලිමඩ, අංක 127 දරණ බණ්ඩාරවෙල, අංක 128 දරණ හපුතල යන මැතිවරණ කොට්ඨාශ ලියාපදිංචිකිරීමේ නිලධාරි තැන.

වර්‍ෂ 1962 ක් වූ මාර්තු මස 29,
ඡන්ද කාර්යාලය,
කච්චේරිය, බදුල්ල.

4-213/12

---

## 1946යේ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### ඡන්දදායක නාමලේඛන සංශෝධනය කිරීම—1961

මැතිවරණ කොට්ඨාශ අංක 130—දැදිගම
මැතිවරණ කොට්ඨාශ අංක 131—ගලිගොමුව
මැතිවරණ කොට්ඨාශ අංක 132—කෑගල්ල
මැතිවරණ කොට්ඨාශ අංක 133—රඹුක්කන
මැතිවරණ කොට්ඨාශ අංක 134—මාවනැල්ල
මැතිවරණ කොට්ඨාශ අංක 135—යටියන්තොට
මැතිවරණ කොට්ඨාශ අංක 136—රුවන්වැල්ල
මැතිවරණ කොට්ඨාශ අංක 137—දෙහිඕවිට

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත්, එකී නාමලේඛන කාර්යාල වේලාවන්හි දී පරීක්‍ෂා කර බලා ගැනීම පිණිස කෑගල්ල කච්චේරියේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
ලියාපදිංචිකිරීමේ නිලධාරිතැන.

මැතිවරණ කොට්ඨාශ අංක 130—දැදිගම, මැතිවරණ කොට්ඨාශ අංක 131—ගලිගොමුව, මැතිවරණ කොට්ඨාශ අංක 132—කෑගල්ල, මැතිවරණ කොට්ඨාශ අංක 133—රඹුක්කන, මැතිවරණ කොට්ඨාශ අංක 134—මාවනැල්ල, මැතිවරණ කොට්ඨාශ අංක 135—යටියන්තොට, මැතිවරණ කොට්ඨාශ අංක 136—රුවන්වැල්ල, මැතිවරණ කොට්ඨාශ අංක 137—දෙහිඕවිට.

1962 මාර්තු මස 31 වෙනි දින,
කෑගල්ලේ කච්චේරියේ දීය.

4-213/13

---

## 1946යේ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ පිළිබඳ) රාජසභා ආඥාව

### 1961 පාර්ලිමේන්තු ඡන්දදායක නාමලේඛන සංශෝධනය කිරීම

අංක 138—කිරිඇල්ල මැතිවරණ කොට්ඨාශය
අංක 139—රත්නපුර මැතිවරණ කොට්ඨාශය
අංක 140—පැල්මඩුල්ල මැතිවරණ කොට්ඨාශය
අංක 141—බලන්ගොඩ මැතිවරණ කොට්ඨාශය
අංක 142—රක්වාණ මැතිවරණ කොට්ඨාශය
අංක 143—නිවිතිගල මැතිවරණ කොට්ඨාශය
අංක 144—කලවාන මැතිවරණ කොට්ඨාශය
අංක 145—කොළොන්න මැතිවරණ කොට්ඨාශය

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත්, එකී නාමලේඛන කාර්යාල වේලාවන්හි දී පරීක්‍ෂා කර බලා ගැනීම පිණිස රත්නපුර කච්චේරියේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආ. රා. රත්නවේල්,
අංක 138—කිරිඇල්ල, අංක 139—රත්නපුර, අංක 140—පැල්මඩුල්ල, අංක 141—බලන්ගොඩ, අංක 142—රක්වාණ, අංක 143—නිවිතිගල, අංක 144—කලවාන, අංක 145—කොළොන්න යන මැතිවරණ කොට්ඨාශවල ලියාපදිංචිකිරීමේ නිලධාරි තැන.

1962 මාර්තු මස 31 වෙනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දී ය.

4-213/14

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### වශ 1944 අංක 42 දරණ වැරදිකරුවන් පරිවාසය යටතේ තබා ගැනීමේ ආඥාපණත

1944 අංක 42 දරණ වැරදිකරුවන් පරිවාසය යටතේ තබා ගැනීමේ ආඥාපණතේ 16 (2) දරණ වගන්තිය අනුව කුරුණෑගල අධිකරණ කොට්ඨාශයේ සෙවණ පරිවාස නිලධාරිනි බී. ජයරත්න නෝනා මහත්මියගේ පත්වීම 1962 ජනවාරි මස 1 වැනි දින සිට කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවලංගු කර ඇති බව එම ආඥාපණතේ 17 (3) වැනි වගන්තිය අනුව මෙයින් දනුම් දෙමි.

ඩී. එම්. පී. බී. දසනායක,
පරිවාස හා ළමා රක්ෂක සේවා කොමසාරිස් තැන.

1962 මාර්තු 19 වැනි දින,
3, වැනි කොළඹ බගතලේ පාරේ,
අංක 3 දරණ ස්ථානයේ පිහිටි පරිවාස හා
ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ දීය.

4-13/1

---

### වශ 1944 අංක 42 දරණ වැරදිකරුවන් පරිවාසය යටතේ තබා ගැනීමේ ආඥාපණත

1944 අංක 42 දරණ වැරදිකරුවන් පරිවාසය යටතේ තබා ගැනීමේ ආඥාපණතේ 16 (1) (බී) දරණ වගන්තිය අනුව ශු. හේරත් නෝනා මහත්මිය කුරුණෑගල අධිකරණ කොට්ඨාශයේ පඩි නොලබන පරිවාස නිලධාරිනියක් වශයෙන් 1962 මාර්තු මස 3 වැනි දින සිට තවදුරටත් නියෝග කරනතුරු පත් කිරීමට කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා සතුටුවී ඇති බව එම ආඥාපණතේ 17 (3) වගන්තිය අනුව මෙයින් දනුම් දෙමි.

ඩී. එම්. පී. බී. දසනායක,
පරිවාස හා ළමා රක්ෂක සේවා කොමසාරිස් තැන.

1962 මාර්තු මස 19 වැනි දින,
පරිවාස හා ළමා රක්ෂක සේවා
දෙපාර්තමේන්තුව,
3, බගතලේ පාර, කොළඹ 3.

4-13/2

---

### ගමනා ගමනයට බාධා—උතුරු කොළඹ ප්‍රදේශය

**කැළණිය - මුදුන් ගොඩ මාර්ගය**

ඉහත සඳහන් මාර්ගයේ අංක 17/6 දරන බෝක්කුව නැවත සෑදීම හේතු කොට ගෙන එම මාර්ගය, රථ වාහන වලට ගමන් කළ නො හැකිවන සේ 62. 4. 4. වන දින සිට නැවත දන්වන තුරු වසා තබනු ලැබේ.

තලවතුගේත්පිට-උඩුපිල මාර්ගය හා උඩුපිල කිරිල්ලව මාර්ගයත් ඒ වෙනුවට යොදා ගත හැකිය.

ඒ. සී. පෙරේරා,
ආණ්ඩුවේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 අප්‍රේල් මස 2 වෙනි දින,
කොළඹ, රජයේ වැඩ කාර්යාලයේදීය.

4-188

---

### ගමනාගමනයට බාධා—උතුරු කොළඹ ප්‍රදේශය

**දළුගම-කැළණිය මාර්ගය**

ඉහත සඳහන් මාර්ගය 62. 4. 4 වෙනි දින සිට, නැවත දන්වන තුරු සියළුම, රථවාහන ගමන් කළ නොහැකිවනසේ වසා තිබේ.

කැළණිය—වෙදමුල්ල මාර්ගය ඒ වෙනුවට යොදාගත හැකිය.

ඒ. සී. පෙරේරා,
ආණ්ඩුවේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 අප්‍රේල් මස 2 වෙනි දින,
කොළඹ, රජයේ වැඩ කාර්යාලයේදීය.

4-189

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය — හලාවත දිස්ත්‍රික්කය

**රථවාහනයන්ට අවහිරවීම**

### කොළඹ - පුත්තලම පාරේ අංක 52/5 පාලම

ඉහත සඳහන් පාලමෙහි තට්ටු ප්‍රතිසංස්කරණය කරන හෙයින් 1962 අප්‍රේල් 1 වනදා සිට 1962 මැයි මස 31 වැනිදා දක්වා උදේ 7.00 සිට සවස 4.30 වනතුරු සියලු රථවාහනයන්ට අවහිරව පවතින බැව් මෙයින් නිවේදනය කරමි.

ඒ. සී. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

1962 අප්‍රේල් මස 2 වැනි දින,
කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේදී.

4-165

---

## "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම්

### සුරාබදු ආඥාපනත

**අංක 500 දරණ සුරාබදු නිවේදනය**

සුරාබදු ආඥාපනතේ (52 වෙනි අධිකාරය) 25 වෙනි වගන්තිය යටතේ, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින්, නියම කරන ලද පරිදි 1962 අප්‍රේල් මස 6 වන දින සිට ඖෂධීය කාර්‍ය්‍ය සඳහා පරිභෝග කිරීමට රා නිපදවීම සඳහා බලපත්‍ර :—

(අ) කොට්ඨාශයේ සහකාර සුරාබදු කොමසාරිස්ගේ අභිමතය පරිදි විශේෂ අනුග්‍රහයක් වශයෙන් ; හා

(ආ) විශේෂ කරුණු අනුව කොට්ඨාශය භාර සුරාබදු කොමසාරිස් විසින් අන් අයුරින් තීරණය නොකළහොත් ඉල්ලුම්කරු වාසය කරන ඉඩම ඇතුළත පිහිටි එකකට නොවැඩි පොල් හෝ කිතුල් හෝ තල් ගසකටද ;

(ඇ) වෛද්‍ය කර්මයෙහි යෙදී සිටින්නන්ගේ ආඥාපනත යටතේ (105 වැනි අධිකාරය) ලියා පදිංචි කරන ලද වෛද්‍යවරයෙකු විසින් පැසුණු රා හිතකර බව සලකන ලද රෝගය සඳහන් කරන ලද වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීමෙන්ද ;

(ඈ) කොට්ඨාශයේ සහකාර සුරාබදු කොමසාරිස්ගේ අභිමතය පරිදි, පළමුව, සමසකට නොවැඩි කාල සීමාවකටද ඉන්පසුව, එක් වරකට සමසකට නොවැඩි කාලසීමා දෙකකට නොවැඩි ගණනක් සඳහාද ;

(ඉ) සමසක කාල සීමාවක් සඳහා ගාස්තුව වශයෙන්—
 (i) පොල් ගසකට රු. 12.50ක් බැගින් හෝ
 (ii) කිතුල් හෝ තල් ගසකට රු. 17.50ක් බැගින් ද ගෙවීමෙන්ද ;

(ඊ) මෙහි දක්වා තිබෙන උපලේඛනයෙහි ආකෘතියෙහි අඩංගු කොන්දේසි හා සීමා කිරීම්වලට යටත්වද ;

ප්‍රදානය කළයුතුය.

එසේ වුවද, (ඈ) ඡේදයෙහි නියමිත කාලසීමාවන්ට අතිරේකව ඒ එක් එක් අතිරේක කාලසීමාව හයමසකට වැඩි නොවනසේ, කලින් ලබාගත් ස්ථිර ලේකම්ගේ අනුමතිය ඇතිව කොට්ඨාශයේ සහකාර සුරාබදු කොමසාරිස් විසින්ම බලපත්‍ර දීර්ඝ කළහැකිය.

1955 පෙබරවාරි 3 වෙනි දින අංක 10,762 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අංක 446 දරණ සුරාබදු නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 මාර්තු මස 29 වන දින,
කොළඹදීය.

අංක වී 35 දරන සුරාබදු ආකෘති පත්‍රය

### උපලේඛනය

**ඖෂධීය කාර්ය සඳහා පරිභෝග කිරීමට පැසුණු රා මැදීමට නිපදවීමට හා බෑමට නිකුත් කරන බලපත්‍රය**

අංකය :————.

ගාස්තුව, රු :————.

බලපත්‍රධාරියාගේ නම සහ ලිපිනය :————.

————.

————.

————.

ගස් වර්ගය :————.

ගස් පිහිටි ඉඩම :————.

ගස් පිහිටි ගම සහ දිස්ත්‍රික්කය :————.

ගසෙහි ලකුණු කරන ලද අංකය :————.

මේ බලපත්‍රයට අදාළ පහත සඳහන් කොන්දේසිවලට හා සෑම සුරාබද්ද බලපත්‍රයන්ට අදාල, එවකට බලපවත්නා පොදු කොන්දේසිවලට යටත්ව, ඖෂධීය කාර්ය සඳහා පරිභෝග කිරීමට පැසුණු රා මැදීම, නිපදවීම සහ බෑම සඳහා :................ ගසකට, .................................................... හි පදිංචි ................ ට මෙයින් බලය දෙනු ලැබේ.

(1) මදිනු ලබන්නේ : කවුරු විසින්ද යනවග :.................... හි

....................................

(සම්පූර්ණ නම යොදන්න).

ගස් මැදීමට හා එයින් රා බෑමට බලපත්‍රධාරියා විසින් සේවයෙහි යොදවනු ලැබීමට මෙයින් බලය දෙනු ලැබේ.

(2) මදින්නා වෙනුවට කෙනෙකු සේවයෙහි යෙදවීම :

බලපත්‍රධාරියා විසින් බලයලත් මදින්නා සඳහා ඔහු/ඇය විසින් පළමුව බලපත්‍රයෙහි පසුපිටෙහි ඒ බවට පිටසනක් කොට බලපත්‍රධාරියා විසින් හෝ ඔහුට/ඇයට ලිවීමට නොහැකිනම් වෙන අයෙකු හෝ අත්සන් කොට දිනය යොදා ආදේශිකයාගේ නමද ලිපිනයද සේවය ආරම්භ වන දිනය හා යථාකල්හි රක්ෂාව අවසන් වන දිනය සඳහන් කිරීමෙන් තාවකාලික ආදේශිකයකු සේවයෙහි යෙදිය හැකිය.

එසේ වුවද

(අ) එවැනි රක්ෂාවක් පටන්ගත් දිනයේ සිට පසළොස්වැනි දිනය පසුවූ විට, හෝ

(ආ) ශෙනහැර දැක්වීමට බැඳී නොමැති කිසියම් හේතුවක් නිසා ආදේශිකයා එසේ යෙදවීමට නුසුදුසුවනවිට ඒ ප්‍රදේශය භාර සුරාබද්ද අධිකාරින් විසින් ලියවිල්ලකින් බලපත්‍රධාරියාට දන්වා සිටීමෙන් පසු හෝ එබඳු පිටසනක් වලංගු ලෙස නොසැලකියයුතුවත් හැර එවැනි ආදේශකයෙකු සේවයේ නොයෙදවිය යුතුය.

(3) මදින ලද රා වලට සුදුස්සක් කිරීම :

(අ) මෙ බලපත්‍රය යටතේ මදින ලද සම්පූර්ණ රා ප්‍රමාණය සපයා බලපත්‍රධාරියා තම සවාමිත්වයෙහි තබාගතයුතු අතර, ඖෂධීය කාර්ය සඳහා ඔහු/ඇය විසින් තම පෞද්ගලික පරිභෝගය සඳහා ගතයුතුය.

(ආ) මෙ බලපත්‍රය යටතේ මදින ලද, බානලද, ප්‍රවාහනය කරන ලද රා විකිණීම හෝ නැගිදීම හෝ ඉහත සඳහන් නොවන අන් දමකට ක්‍රියා කිරීම හෝ නොකළයුතුය. කවර දවසක වුවද පරිභෝග නොකර ඉතුරුවී ඇති රා සියල්ලම ඊළග දවසේ රා ලැබීමට පෙර විනාශකළ යුතුය.

(4) රා මැදීමේ සහ බෑමේ කාලවේලාව :

පස්වරු 6 ටත් පෙරවරු 5 ටත් අතර කල්හි ගස් නොමැදිය යුතුය.

(5) එක්තරා පැය ගණනකට පසු රා වත්තෙහි තබා නොගැනීම :

උදේ එකතු කිරීමේදී නම් කවර දිනයක වුවද පෙරවරු 10 ට පසුව (ගසෙහි මුට්ටිය එල්ලා තිබීම හැර) හෝ සවස එකතු කිරීමේදී නම් කවර දිනයක වුවද පස්වරු 5.30 ට පසුවද බාන ලද රා වත්තෙහි නොතැබිය යුතුය.

(6) ගස් ලකුණු කිරීමට පළමු මැදීමේ තහනම :

සුරාබද්ද කොමසාරිස් විසින් නියමිත අන්දමට සුරාබද්ද නිලධාරියෙක් විසින් ගස් ලකුණු දමන තුරු, මේ බලපත්‍රය යටතේ කිසිම ගසක් මැදීම හෝ මොනයම් ගසකින්වත් පැහුණු රා බෑම හෝ රා නිපදවන මොනයම් ගසකින්වත් පැහුණු රා බෑම හෝ රා නිපදවන මොනයම් ගසකටවත් මුට්ටියක් එල්ලීම හෝ මේ බලපත්‍රය යටතේ ලකුණු කරන ලද ගස් හැර වෙනත් ගසක් මැදීම බලපත්‍රධාරියා විසින් නොකළයුතුය.

(7) සෝදිසි කිරීම සඳහා බලපත්‍රධාරියා විසින් මුට්ටි ගෙනයාමට බැඳී සිටීම :

යම් සුරාබද්ද නිලධාරියකු හෝ ගම්මුලාදෑනියකු විසින් ඉල්වා සිටිකල්හි ගසට එල්ලා ඇති මොනයම් මුට්ටියක් හෝ වෙනත් භාජනයක් පරීක්ෂණය සඳහා බිමට බෑම හෝ බිමට බෑවීම බලපත්‍රධාරියා සහ බලයලත් හෝ ආදේශක මදින්නාගේ යුතුකමවිය යුතුය.

(8) සවාමිත්වයෙහි තබාගතහැකි ප්‍රමාණයේ සීමාව :

මේ බලපත්‍රය යටතේ කවර වේලාවක වුවද බලපත්‍රධාරියා විසින් එක් ගැළුමකට වඩා ප්‍රමාණයක් තම සවාමිත්වයෙහි තබා නොගත යුතුය. මේ කොන්දේසිය කඩකිරීම හේතුවෙන් බලපත්‍රය අවලංගු කිරීමට යටත්විය යුතුය.

(9) බලපත්‍ර වලංගු කාල සීමාව :

කලින් අන් ලෙසක අවසන් නොකළ හොත් බලපත්‍රය ........... දින සිට ...................... දින දක්වා වලංගුව පැවතිය යුතුය.

————,

කොට්ඨාශය භාර සහකාර සුරාබද්ද කොමසාරිස්.

දිනය :————.

(අදාල නොවන දෑ කපා හරින්න)

## ඖෂධීය කාර්ය සඳහා පැසුණු රා මැදීමට නිපදවීමට හා බෑමට නිකුත් කරන බලපත්‍රය

අංකය :————.

ගාස්තුව : රුපියල් :————.

බලපත්‍රධාරියාගේ නම සහ ලිපිනය :————.

————

————

————

ශත -/50 ක මුද්දරය

————

ගස් වර්ගය :————.

ගස් පිහිටි ඉඩම :————.

ගස් පිහිටි ගම සහ දිස්ත්‍රික්කය :————.

ගසෙහි ලකුණු කරන අංකය :————.

————,

කොට්ඨාශ භාර සහකාර සුරාබද්ද කොමසාරිස්.

නිකුත්කළ දිනය :————.

### අනුපූර්ණ ගිවිසුම

මෙ බලපත්‍රයට අදාල පහත පෙනෙන විශේෂ කොන්දේසිවලට හා සෑම සුරාබද්ද බලපත්‍රයන්ට අදාල එවකට බලපවත්නා පොදු කොන්දේසිවලට යටත්ව ...................... දින පටන්ගෙන ................ දින දක්වා අවසන්වන කාල සීමාව තුල ඖෂධීය කාර්ය සඳහා එක් ...................... ගසකින් විශේෂ අනුග්‍රහයක් ලෙස පැසුණු රා මැදීම, නිපදවීම සහ බෑම සඳහා නිකුත්කරන ලද (මේ එකී උප පත්‍රිකාවන් වන) බලපත්‍රයෙහි අඩංගු නියමයන් හා කොන්දේසි හොඳිනුත් අවංක ලෙසත් ඉටුකරනු ලබන බවටද පිළිපදිනු ලබන බවටද එකී බලපත්‍රධාරියා වන මම ................................ කොට්ඨාශය භාර සුරාබද්ද කොමසාරිස් සමග මෙයින් එකඟවෙමි.

(1) මදිනු ලබන්නේ කවුරු විසින්ද ............................ හි

————,

(සම්පූර්ණ නම යොදන්න)

ගස් මැදීමට හා එයින් රා බෑමට බලපත්‍රධාරියා විසින් සේවයෙහි යොදවනු ලැබීමට මෙයින් බලය දෙනු ලැබේ.

(2) මදින්නා වෙනුවට කෙනෙකු සේවයෙහි යෙදවීම :

බලපත්‍රධාරියා විසින් බලයලත් මදින්නා සඳහා ඔහු/ඇය විසින් පළමුව බලපත්‍රයෙහි පසුපිටෙහි ඒ බවට පිටසනක් කොට බලපත්‍රධාරියා විසින්. හෝ ඔහුට/ඇයට ලිවීමට නොහැකිනම් ඒ වෙනුවෙන් වෙන අයෙකු හෝ අත්සන්කොට දිනය යොදා ආදේශකයාගේ නමද ලිපිනයද සේවය ආරම්භ වන දිනය හා යොදා යථාකල්හි රක්ෂාව අවසන්වන දිනය සඳහන් කිරීමෙන් තාවකාලික ආදේශකයෙකු සේවයෙහි යෙදිය හැකිය.

එසේ වුවද

(අ) එවැනි රක්ෂාවක් පටන්ගත් දිනයේ සිට පසළොස්වැනි දිනය පසුවූ විට හෝ

(ආ) ශෙනහැර දැක්වීමට බැඳී නොමැති කිසියම් හේතුවක් නිසා හෝ ආදේශකයා එසේ යෙදවීමට නුසුදුසු වන විට ඒ ප්‍රදේශය භාර සුරාබද්ද අධිකාරින් විසින් ලියවිල්ලකින් බලපත්‍රධාරියාට දන්වා සිටීමෙන් පසු එබඳු පිටසනක් වලංගු ලෙස නොසැලකිය යුතුවත් හැර එවැනි ආදේශකයකු සේවයෙහි නොයෙදවිය යුතුය.

(3) මදින ලද රා වලට සුදුස්සක් කිරීම :

(අ) මේ බලපත්‍රය යටතේ මදින ලද සම්පූර්ණ රා ප්‍රමාණය සපයා බලපත්‍රධාරියා තම සවාමිත්වයෙහි තබාගතයුතු අතර, ඖෂධීය කාර්ය සඳහා ඔහු/ඇය විසින් තම පෞද්ගලික පරිභෝගය සඳහා ගතයුතුය.

(ආ) මේ බලපත්‍රය යටතේ මදින ලද, බාන ලද, ප්‍රවාහනය කරන ලද රා විකිණීම හෝ නැගිදීම හෝ ඉහත සඳහන් නොවන අන් දමකට ක්‍රියාකිරීම හෝ නොකළයුතුය. කවර දවසක වුවද පරිභෝග නොකර ඉතුරු වී ඇති රා සියල්ලම ඊළඟ දවසේ රා ලැබීමට පෙර විනාශකළ යුතුය.

(4) රා මැදීමේ සහ බෑමේ කාලවේල් වල් :

පස් වරු 6 ටත් පෙරවරු 5 ටත් අතර කල්හි ගස් නො මැදිය යුතුය.

(5) එක්තරා පැය ගණනකට පසු රා වත්තෙහි තබා නොගැනීම :

උදේ එකතු කිරීමේදී නම් කවර දිනයක වුවද පෙරවරු 10 ට පසුව (ගසෙහි මුට්ටිය එල්ලා තිබීම හැර) හෝ සවස එකතු කිරීමේදී නම් කවර දිනයක වුවද පස් වරු 5.30 ට පසුවද බාන ලද රා වත්තෙහි නොතැබිය යුතුය.

(6) ගස් ලකුණු කිරීමට පළමු මැදීමේ තහනම :

සුරාබදු කොමසාරිස් විසින් නියමිත අන්දමට සුරාබදු නිලධාරියෙක් විසින් ගස් ලකුණු දමන තුරු, මේ බලපත්‍රය යටතේ කිසිම ගසක් මැදීම හෝ මොනයම් ගසකින්වත් පැහුණු රා බෑම හෝ රා නිපදවන මොනයම් ගසකින්වත් පැහුණු රා බෑම හෝ රා නිපදවන මොනයම් ගසකටවත් මුට්ටියක් එල්ලීම හෝ මේ බලපත්‍රය යටතේ ලකුණු කරන ලද ගස් හැර වෙනත් ගසක් මැදීම බලපත්‍රධාරියා විසින් නොකළ යුතුය.

(7) සෝදිසි කිරීම සඳහා බලපත්‍රධාරියා විසින් මුට්ටි ගෙනයාමට බැඳී සිටීම :

යම් සුරාබදු නිලධාරියකු හෝ ගම්මුලාදෑනියකු විසින් ගසට එල්ලා ඇති මොනයම් මුට්ටියක් හෝ වෙනත් භාජනයක් පරීක්ෂණය සඳහා බිමට බෑම හෝ බිමට බෑවීම බලපත්‍රධාරියාගේ සහ බලයලත් හෝ ආදේශක මදින්නාගේ යුතුකම විය යුතුය.

(8) සවාමිත්වයෙහි තබාගතහැකි ප්‍රමාණයේ සීමාව :

මේ බලපත්‍රය යටතේ කවර වේලාවක වුවද බලපත්‍රධාරියා විසින් එක් ගැළුමකට වඩා ප්‍රමාණයක් තම සවාමිත්වයෙහි තබා නොගත යුතුය. මේ කොන්දේසිය කඩකිරීම හේතු වෙන් බලපත්‍රය අවලංගු කිරීමට යටත් විය යුතුය.

(9) බලපත්‍ර වලංගු කාල සීමාව :

කලින් අන්ලෙසක අවසන් නොකළහොත් බලපත්‍රය ........................දින සිට ........................ දින දක්වා වලංගුව පැවතිය යුතුය.

————,
අත් සන.

දිනය :————.

සාක්ෂි කරුවෝ

1. ————.

2. ————.

196........................ මස ............ වෙනි දින දිය.

(අදාල නොවන දෑ කපාහරින්න)

4-118

## විශෙෂ නිවේදනයයි

1962 අප්‍රේල් 14 වෙනි සෙනසුරාදා සහ 20 වෙනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1962 අප්‍රේල් 19 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 අප්‍රේල් 13 වැනි සිකුරාදා පස්වරු 3.30ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 අප්‍රේල් 6 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද, සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා, මනි ඕඩරයක් පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් **කිරීම පිළිබඳ** කරන දැන්වීම් හෝ පළ කරනු නොලබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරණ ගාස්තු මෙසේයි :—

| | | |
|---|---|---|
| | රු. | ශ. |
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. **ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි. (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **දායක ගාස්තු :—**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | පිටරට |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| එක්කොටසක් ... ... .... | 22 50 | ... | 35 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 12 50 | ... | 18 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 20 0 | ... | 28 0 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිල | | තැපැල් ගාස්තු මෙරට |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී **එක කොටසක්** ... | 0 25 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක **කොටසක්** ... | 0 50 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, 1 වැනි කොටසේ එක් ඡේදයක් ... | 0 10 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 20 | ... | 0 15 |

**දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**